## අයදුම්පත් කැඳවීමේ නිවේදනය

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව
### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

01. අංක 1836/6 හා 2013-11-11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ (III) උපලේඛනයේ 1 වන පරිශිෂ්ඨයේ සඳහන් විශේෂ ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා එම ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3.1 වගන්තියට අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සුදුසුකම් ලත් 1 ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් තනතුරට අදාල කාණ්ඩයන් යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත තනතුරු අතුරින් එකක් හෝ කිහිපයක් නොපුරවා තැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත

| අනු අංකය | අනුමත තනතුර | අමාත්‍යාංශය | තනතුර අයත් කාණ්ඩය | පුරප්පාඩු වූ දිනය |
|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් (තාක්ෂණ) | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය | සියළුම සිවිල් | 2020.04.01 |
| 2 | අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය | සියළුම සිවිල් | 2020.01.29 |
| 3 | අතිරේක ලේකම් (ඉදිකිරීම්) | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය | සියළුම සිවිල් | 2020.01.10 |
| 4 | අතිරේක ලේකම් (වාරිමාර්ග සංවර්ධන) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය. | සිවිල් 03 | 2020.08.24 |
| 5 | අතිරේක ලේකම් (ජල සම්පත් කළමනාකරණ) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය. | සිවිල් 03 | 2018.07.31 |
| 6 | අතිරේක ලේකම් (ඉංජිනේරු තාක්ෂණ සේවා හා ප්‍රසම්පාදන) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය. | සිවිල් 03 | 2019.06.20 |
| 7 | අතිරේක ලේකම් (ජල සම්පත් කළමණාකරණ) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය. | සිවිල් 03 | 2020.04.03 |
| 8 | අතිරේක ලේකම් (තාක්ෂණ) | මගී ප්‍රවාහන කළමනාකරණ අමාත්‍යාංශය | සිවිල් 04<br>යාන්ත්‍රික 02<br>විදුලි 01 | 2019.01.31 |
| 9 | අතිරේක ලේකම් (තාක්ෂණ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | සියළුම සිවිල් | 2020.07.14 |
| 10 | අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) | අධ්‍යාපන අමාත්‍යාංශය | සියළුම සිවිල් | 2018.05.30 |
| 11 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | රජයේ කර්මාන්තශාලාව | යාන්ත්‍රික 01 | 2019.05.01 |
| 12 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සිවිල් 03 | 2020.05.18 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සිවිල් 03 | 2020.03.13 |
| 14 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධර කළමනාකරණ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සිවිල් 03 | 2019.05.05 |
| 15 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | සිවිල් 05 | 2019.11.03 |
| 16 | අතිරේක සාමාන්‍යාධිකාරී(යටිතල පහසුකම්) | දුම්රිය දෙපාර්තමේන්තුව | සිවිල් 04 | 2019.02.01 |
| 17 | අතිරේක සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික) | දුම්රිය දෙපාර්තමේන්තුව | යාන්ත්‍රික 02 | 2020.05.04 |
| 18 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | මධ්‍යම පළාත් සභාව | සිවිල් 07 | 2018.10.12 |
| 19 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | උතුරු මැද පළාත් සභාව | සිවිල් 07 | 2018.10.12 |
| 20 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | වයඹ පළාත් සභාව | සිවිල් 07 | 2018.10.12 |
| 21 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | සබරගමුව පළාත් සභාව | සිවිල් 07 | 2019.03.29 |
| 22 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | දකුණු පළාත් සභාව | සිවිල් 07 | 2018.10.12 |
| 23 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) | ඌව පළාත් සභාව | සිවිල් 07 | 2019.10.28 |

❖ ***සටහන***

අයදුම්කරු තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම්, විශේෂ ශ්‍රේණියේ තනතුරු උපරිම වශයෙන් 05 ක් අයදුම්කරුගේ මනාපය අනුපිළිවෙලට ඇතුලත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කරනු ලබන්නේ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට වේ.

02. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

II. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහල මට්ටමක පැවතීම.

IV. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

V. **(අ.)** ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෙනත් ඉංජිනේරුමය ආයතනයකින් ලබාගත් ඊට සමාන අධි සාමාජිකත්වය ලබා තිබීම. මෙහිදී වරලත් ඉංජිනේරු තත්වය ලැබූ ඉංජිනේරු ක්ෂේත්‍රයේම අධි සාමාජිකත්වය ලබා එම සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම අනිවාර්ය අවශ්‍යතාවයකි.

**හෝ**

**(ආ.)** මාස 09 කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය ලබා තිබීම සමග වරලත් ඉංජිනේරු තත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබීම.

❖ <u>*සටහන*</u>

i. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හැර වෙනත් ආයතනයකින් අධි සාමාජිකත්වය ලබා ඇත්නම්, එම ආයතනය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගන්නා ආයතනයක් බවට සනාථ කෙරෙන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

ii. අධි සාමාජිකත්වය පිරිනමන ලද සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

iii. අධි සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති බව සනාථ කෙරෙන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

iv අයදුම්කරුවන් ඉහත සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට සියළු ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. උසස් කිරීමේ ක්‍රමය

3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සේවා කාලය හා කුසලතාව සැලකිල්ලට ගෙන පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

3.2 සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

**(අ) ජ්‍යෙෂ්ඨතාවය - (උපරිම ලකුණු 60)**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සක්‍රීය අවුරුදු 18ක සේවා කාලය හා I ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන සෑම වසරක් සඳහාම එක් වසරකට ලකුණු 06 බැගින්ද, මාස 6 කට නොඅඩු කාලයක් සඳහා ලකුණු 03 බැගින්ද, මාස 3කට නොඅඩු කාලයක් සඳහා ලකුණු 1.5 බැගින්ද ලකුණු ලබාදෙනු ලැබේ. (ජ්‍යෙෂ්ඨතාවය යටතේ ලකුණු ලබාදීමේදී සේවා කාලය සලකා බලනුයේ නිත්‍ය සේවයට පත් කළ හෝ නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ දින සිටය.)

**(ආ) කුසලතාවය - (උපරිම ලකුණු 40)**

**(ආ .01) නව්‍යතාවයන් හා නවෝත්පාදනයන් (Innovativeness and Creativity) - ලකුණු 10**

ආයතනයේ හා සේවයේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අයදුම්කරු විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද, එක් වැඩසටහනක්/ ව්‍යාපෘතියක් සඳහා ලකුණු 2.5 බැගින් වැඩසටහන්/ ව්‍යාපෘති 04 ක් සඳහා උපරිම ලකුණු 10ක් ලබාදෙනු ලැබේ.

❖ සටහන

(අ) අයදුම්කරුවන්ගේ පසුගිය වසර 05 ක කාර්ය සාධන වාර්තා පදනම් කරගෙන උක්ත වැඩසටහන්/ ව්‍යාපෘති හඳුනාගනු ලබයි,

(ආ) ඒවා සාර්ථකව නිම කරන ලද බවට තහවුරු කෙරෙන ප්‍රදානයන්, ප්‍රශංසා හෝ සහතික පත්‍ර අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

හෝ

(ඇ) ඉහත කාර්යයන් ක්‍රියාත්මක කළ බව සනාථ කළ හැකි සහතික/ ඡායාරූප/ සැලසුම්/ පිඹුරුපත්/ තාක්ෂණික වාර්තා හෝ වෙනත් ලිපි ලේඛණ ඉදිරිපත් කළ යුතු වේ.

**(ආ .02) වෘත්තිය නිපුණතාවය - උපරිම ලකුණු 15**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරියෙකු III ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණිය දක්වා උසස් කිරීමේදී විවිධ ඉංජිනේරුමය අංශ තුළ ලබාගත යුතු ඉංජිනේරුමය නිපුණතාවයන් මෙහිදී පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

(අ) ඉංජිනේරුමය සමීක්ෂණ/ පර්යේෂණ/ සැලසුම් හා ක්‍රම සැලසුම්
(Engineering Investigation/ Research/ Design & Planning)

(ආ) ඉංජිනේරුමය ඉදිකිරීම් හා නිර්මාණ
(Implementation of Engineering Construction & Development)

(ඇ) ඉංජිනේරුමය සේවා/ නඩත්තු/ මෙහෙයුම් හා පද්ධති/ ව්‍යාපෘති කළමනාකරණය
(Engineering Services/Maintenance/Operation & System/Project Management)

ඉහත (අ), (ආ) හා (ඇ) යටතේ සඳහන් එක් කාර්යයක උපරිමය වර්ෂ 03 ක් සඳහා ලකුණු 05 බැගින් වන පරිදි ඉහත කාර්යයන් තුනට ලකුණු 15 ක් ලබාදෙනු ලැබේ. එම කාර්යයන් ක්‍රියාත්මක කළ බව සනාථ කළ හැකි සහතික/ඡායාරූප/සැලසුම්/පිඹුරුපත්/තාක්ෂණික වාර්තා හෝ වෙනත් ලිපි ලේඛණ ඉදිරිපත් කළ යුතු වේ.

**(ආ.03) ඉදිරිපත් කිරීම (Power Point Presentation) - ලකුණු 10**

ඉහත (ආ 01) හා (ආ 02) ට අදාළ ව්‍යාපෘතියක් / වැඩසටහනක් සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් (Power Point) සිදුකරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| i. | අරමුණු හා දැක්ම (Objectives and Vision) | ලකුණු 02 |
| ii. | අදාළත්වය (Relevancy) | ලකුණු 02 |
| iii. | නිර්මාණශීලි බව (Creativity) | ලකුණු 02 |
| iv. | කාල කළමනාකරණය (Time Management) | ලකුණු 02 |
| v. | වෙනත් භාෂා ප්‍රවීනතාවය | ලකුණු 02 |

❖ සටහන

(අ) ඉහත නිර්ණායක යටතේ ලකුණු ලබාගත හැක්කේ අයදුම්කරු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවා ගනු ලැබූ භාෂාවට අන්‍ය වූ රාජ්‍ය භාෂාව / සන්ධාන භාෂාව මඟින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන්නේ නම් පමණි.

(ආ) මෙම ඉදිරිපත් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විනාඩි 05ක කාලයක් අයදුම්කරුගෙන් ප්‍රශ්න අසනු ලැබේ.

(ඇ) ඉදිරිපත් කිරිමට අදාල දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේදි ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක්ද මෙම අවස්ථාවේ ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

**(ආ .04) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය - ලකුණු 05**

ඉහත ඉදිරිපත් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරනු ලබන ගැටලු වලට අදාළව පහත කරුණු යටතේ අයදුම්කරුවන්ට උපරිම ලකුණු 05 ක් ප්‍රදානය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| i. | නායකත්වය (Leadership) | ලකුණු 01 |
| ii. | සන්නිවේදන කුසලතාවයන් (Communication Skills) | ලකුණු 01 |
| iii. | ආත්ම විශ්වාසය (Confidence) | ලකුණු 01 |
| iv. | තීරණ ගැනීමේ හැකියාව සහ විචක්ෂණශීලී බව (Analytical Thinking) | ලකුණු 01 |
| v. | වෘත්තීය ආචාරශීලී බව (Professional Courtesy) | ලකුණු 01 |

❖ *සටහන*

සම්මුඛ පරීක්ෂණයේදී එම කුසලතාවයන් සනාථ කෙරෙන ලිපිලේඛන ඉදිරිපත් කල යුතු වන අතර සේවා පලපුරුද්ද සනාථ කෙරෙන ලිපි සහතික කරන ලද පිටපත්ද සමගින් ඉදිරිපත් කළ යුතුය.

04. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත **2020.12.18** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ඉහත මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, අයදුම්පත් ඉදිරිපත් කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

"රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි"

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2020.11.12